**ශීර්ෂය 019- පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 019 - පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **මෙම වාර්තාවේ ඡේදයට යොමුව** |
|---|---|
| අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය | 1.6.1 (ඇ)(i) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් නොවන ලැබීම්**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගාස්තු, අධිභාර, දඩමුදල් හා බලපත්‍ර රු.49,724 ක් සහ ආදායම් නොවන ලැබීම් රු.219,869 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණ ද, එවැනි ශේෂයක් ආයතනයේ ශේෂ පිරික්සුමේ ඇතුළත්ව නොතිබුණි. | එම මුදල්, මුදල් පොතෙහි ලැබීම් තීරුවේ ගාස්තු හා ආදායම් ලැබීම්වල එකතුවයි. | ආයතනයේ ශේෂ පිරික්සුමේ ඇතුලත් කරුණු පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වේ. |

(ආ) **පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශේෂ පිරික්සුමට අනුව සමාලෝචිත වර්ෂයේ රු.230,982 ක් වූ සහනාධාර හා මාරු කිරීම් වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | නිරීක්ෂණය පිළිගතිමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු ඇතුළත් කළ යුතු වේ. |

(ඇ) **මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 10,586,372 ක් සහ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 14,244,186 ක් වීමෙන් මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 3,657,814 ක් වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.එසේම එම වටිනාකමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැසඳී නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

**(ඇ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව රු.1,352,333 ක් වූ ධන ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඉකුත් වර්ෂයේ අගයන්හි ඍණ ශේෂයක් ලෙස දක්වා තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් නිවැරදිව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |
| (ii) | ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් එකතු කර තිබූ රු.1,628,505 ක ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබූ අතර අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එය රු.1,537,355 ක් ලෙස රු.91,150 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරමි | මූල්‍ය ප්‍රකාශනවල හා අදාල ආකෘතිවල නිවැරදිව තොරතුරු ඇතුළත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බැවින්, 2106 - මෘදුකාංග සංවර්ධන වැය විෂයය යටතේ වෙන් කර තිබූ රු.500,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනය ඉතිරිවීමට හේතු ලෙස දක්වා තිබූ මෘදුකාංග සංවර්ධන කාර්යය සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම යන්න විගණනයට පිළිගත නොහැකි විය . | ප්‍රතිපාදන වෙන් කර දී තිබූ නමුත් භාණ්ඩාගාරය මඟින් ප්‍රාග්ධන වැය විෂයයන්වල වියදම් දැරීම අත්‍යාවශ්‍ය කටයුතු සඳහා සීමා කිරීමට ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් උපදෙස් ලබා දී තිබූ බැවින් මෙකී ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව කාරුණිකව සඳහන් කරමි. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා නිවැරදි හේතු දැක්විය යුතු වේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණ | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | **රු.** | | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) මුදල් රෙගුලාසි 138(5) , 231(1) | 113,876 | අවස්ථා 07කදී ඉන්වොයිස් වල මුල් පිටපත් වෙනුවට ඡායා පිටපත් සඳහා වියදම සහතික කර ගෙවීම් සිදු කර තිබුණි. | ඉන්වොයිසියේ මුල් පිටපත උපයෝගී කර ගනිමින් ගෙවිය යුතු වූ මුදලෙන් අක් මුදල් පවතින ප්‍රමාණය පමණක් ගෙවා ඉතිරි වූ මුදල අක්මුදල් ලැබීමෙන් පසු නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබ ඇත. ඉදිරියේ දී එවැනි අවස්ථාවලදී ඉතිරි මුදල් ගෙවන වවුචරය තුල විශේෂ සටහනක් යෙදීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉන්වොයිසිවල මුල් පිටපත් සඳහා ගෙවීම් කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 267 (1) | 23,092,667 | සේවකයෙකුගේ වැටුප /වේතනය ආදායකයාටම ගෙවා එය භාරගත්බවට ආදායකයාගේ අත්සන නොමැතිව වැටුප් ගෙවා තිබූ අවස්ථා 12 ක් විය. | මේ වන විට පඩි සටහන් පත්‍රයේ අත්සන් තබා ගැනීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කරනු ලබන බැවින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වේතනය ආදායකයාටම ගෙවා එය භාරගත් බවට ආදායකයාගේ අත්සන පඩි ලැයිස්තුවෙහි තබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | | |
| (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ IV ඡේදය | 2,558,370 | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව වේලාව පදනම් කර ගනිමින් ගෙවනු ලබන අතිකාල හා දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කර ගත යුතු වුවද, 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අතිකාල හා දීමනා එසේ සනාථ කර ගැනීමෙන් තොරව ගෙවා තිබුණි. | මෙම අතිකාල ගෙවීම් සිදු කර ඇත්තේ ක්ෂේත්‍රයේ රාජකාරීවල නිරතවන නිලධාරීන්ට වේ. ඔවුන්ගේ රාජකාරී අධීක්ෂණය කරන ආසන්නතම අධීක්ෂණ විධායක/ මාණ්ඩලික නිලධාරී විසින් සිදු කරන පැමිණීමේ හා පිටවීමේ සනාථන පදනම් කර ගනිමින් අතිකාල ගෙවීම සිදුකර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009,2009 ජුනි 17 දිනැති අංක 09/2009 (1) සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛ | අමාත්‍ය කාර්ය මණ්ඩල, අමාත්‍යාංශ ලේකම්වරුන්, ආයතන ප්‍රධානින් ඇතුළු සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවද, විගණිත දිනය වූ 2023 පෙබරවාරි 08 වන දින දක්වාම ආයතනයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවි කිරීම සම්බන්ධයෙන් වැඩකටයුතු ඉදිරියේ දී සිදු කරනු ලබයි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

**3.1.1. ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 13 හි 4 ජේදයට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. | සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරියේදී පිළියෙල කරනු ලැබේ. | චක්‍රලේඛයේ දැක්වෙන මාර්ගෝපදේශයන්ට අනුව, සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනු ලබන දිනවලදී ප.ව.5.30 න් පසු රාජකාරියේ නිරතවීම වෙනුවෙන් ගෙවනු ලබන ප්‍රවාහන දීමනාව, ප.ව.5.30 ට පෙර පාර්ලිමේන්තු රැස්වීම් අවසන්ව තිබූ දින 2 ක් සඳහා ද එකතුව රු.56,250 ක් කාර්ය මණ්ඩල උපදේශක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවා තිබුණි. නමුත් විගණිත දිනය වූ 2023 පෙබරවාරි 08 වන විටත් එම අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප.ව 5.30ට පෙර පාර්ලිමේන්තු රැස්වීම් අවසන් වූ එම දින දෙක සඳහා ගෙවන ලද ප්‍රවාහන දීමනාව අදාල නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු යොදා ඇත. | අවශ්‍ය අනුමැතීන්ට යටත්ව ගෙවීම් සිදුකළ යුතු වේ. |

## 4 යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත සේවක සංඛ්‍යාව තුල ඇතිකොට ඉදිරියේ දී පරිපාලන කටයුතු තුල අභ්‍යන්තර විගණනය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ දැක්වෙන විධිවිධානයන්ට අනුකූල විය යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.3 ඡේදය ප්‍රකාරව එක් එක් නිලධාරී තලය අනුව හඳුනාගත් නිපුනතා ඉලක්ක සපුරා | වර්ෂයට අදාළ මානව සම්පත් සැලැස්ම තුල පුහුණු අවස්ථා හඳුනාගෙන ඇති අතර, පවතින ප්‍රතිපාදන මත අවශ්‍ය පරිදි | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

ගැනීම සඳහා සකස් කළ යුතු සුදුසු ධාරිතා සංවර්ධන වැඩසටහන් සකස් කර නොතිබුණු අතර චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

ප්‍රමාණවත් පුහුණු අවස්ථා ඉටු කර ඇත. කාර්යාලයේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදුවන බැවින් එයින් පසු කාර්ය සාධන ගිවිසුම් යාවත්කාලීන කිරිමට කටයුතු කරනු ලැබේ